SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය **පළමු වාර පරීක්ෂණය - 2019**

නම/විභාග අංකය ....

භූගෝල විද්‍යාව **කාලය පැය දෙකයි**

උපදෙස් : I කොටසේ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
II කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. ආසියා මහද්වීපය පෘතුවියේ උතුරු අර්ධ ගෝලයේ .... කොටසේ පිහිටා ඇත.
(බටහිර / නැගෙනහිර / දකුණු)

02. පෘතුවියේ මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් .... ක් පමණ ආසියා මහද්වීපයට අයත්වේ.
(30% / 50% / 60%)

03. ලොව වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන .... අයත් වන්නේ ආසියා මහද්වීපයටයි.
(ඉන්දුනිසියාව / ඉන්දියාව / චීනය)

04. යූරල් ගංගාව .... මුහුදට ගලා බසී.
(ඒරල් / කැසිපියන් / කළු)

05. ශීත දේශගුණයක් පවතින කලාපය තුළ .... වනාන්තර පිහිටා ඇත.
(කේතුධර / පතනශීල / වර්ෂා)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. ලෝක ජන සංඛ්‍යාවෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් ආසියාවේ වාසය කරති. (.......)
07. ජපානය සම්පූර්ණයෙන්ම අමුද්‍රව්‍ය සහ ඛනිජතෙල් ආනයනය මත කර්මාන්ත පවත්වාගෙන යයි. (.......)
08. ගංගා නම් ගඟ ආසියාවේ දිගම ගංගාව වේ. (.......)
09. ඩෙකෑන් සානුව ''ලෝකයේ පියස්ස'' යන අන්වර්ථ නාමයෙන් හඳුන්වයි. (.......)
10. ඩුබායි, එමිරේට්ස් රාජ්‍යයන් හතට අයත් එක් රටකි. (.......)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ආසියා මහද්වීපයේ පිහිටා ඇති ප්‍රමාණයෙන් කුඩා දූපත් වලට අයත් වන්නේ මින් කුමක්ද?
01. පිලිපීන දූපත් 02. නිකෝබාර් දූපත් 03. ශ්‍රී ලංකාව 04. තායිවානය

12. ආසියාවට අයත් නොවන ඉපැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරය මින් කුමක්ද?
01. ඉන්දු නිම්න ය 02. හොවැංහෝ නිම්නය
03. යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්නය 04. නයිල් නිම්නය

13. පහත සඳහන් විල් අතරින් ආසියාවේ පිහිටි ලොව ගැඹුරුම මිරිදිය විල කුමක්ද?
01. බයිකල් විල 02. බෝල්කෑෂ් විල 03. අයර් විල 04. වික්ටෝරියා විල

14. මෝටර් සයිකල් නිෂ්පාදනය සඳහා ප්‍රමුඛත්වයක් ගන්නා ජපන් සමාගම් දෙක ඇතුළත් වරණය තෝරන්න.
01. ටොයෝටා, හොන්ඩා 02. හොන්ඩා, යමහා
03. යමහා, මිට්ෂුබිසි 04. නිසාන්, කවසාකි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

15. වැලිපරයක් සහිත පටු විවරයකින් සාගරය හා සම්බන්ධවන කිවුල් දිය පිරුණු නොගැඹුරු ජලාශය හඳුන්වන නම කුමක්ද ?

    01. වගුරු බිම 02. ඩෙල්ටාව
    03. කලපුව 04. බොක්ක

- **පහත 'අ' තීරුවේ දක්වෙන තොරතුරු වලට අදාල තොරතුරු ''ආ'' තීරුවෙන් තෝරා ඊට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියන්න.**

16. නිවර්තන වර්ෂා වනාන්තර	(...........)	A. වර්කොයැන්ස්ක්
17. පතනශීලී වනාන්තර	(...........)	B. පයින්, ස්පෲස්
18. කේතුධර වනාන්තර	(...........)	C. ජකෝබාබාද්
19. අසියාවේ අඩුම උෂ්ණත්වය	(...........)	D. රෝස්වුඩ්, මැහෝගනී
20. ආසියාවේ ඉහළම උෂ්ණත්වය	(...........)	E. ඕක්, මල්බෙරි

II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්ණ 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01. අ) පහත දක්වෙන ආසියාවේ සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. A අක්ෂරයෙන් දක්වෙන කඳුවැටිය නම් කරන්න. ල. 01

ii. B අක්ෂරයෙන් දක්වෙන ගංගාව නම් කරන්න. ල. 01

iii. කහ මුහුද දක්වෙන අක්ෂරය කුමක් ද? ල. 01

iv. E අක්ෂරයෙන් දක්වෙන රට කුමක් ද? ල. 01

v. G අක්ෂරයෙන් දක්වෙන සානුව කුමක් ද? ල. 01

vi. ජාවා දූපත දක්වෙන්නේ කවර අක්ෂරයෙන් ද? ල. 01

vii. K අක්ෂරයෙන් දක්වෙන භෞතික ලක්ෂණය කුමක් ද? ල. 01

viii. නැගෙනහිර දේශාංශ 25^0 රේඛාව දක්වෙන අක්ෂරය කුමක් ද? ල. 01

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(ආ) ආසියාව, යුරෝපයෙන් හා අප්‍රිකාවෙන් වෙන් කෙරෙන මායිම් (සීමා) කිහිපයක් 1, 2, 3 හා 4 අංක වලින් දක්වේ. ඒවා නම් කරන්න.

1. .... කඳුවැටිය　　03. .... ඇළ

2. .... මුහුද　　04. .... මුහුද

(ල. 08)

02. (i) ආසියා මහද්වීපයේ දක්නට ලැබෙන දේශගුණ වර්ග ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

(ල. 08)

දේශගුණික කලාපය	දේශගුණ වර්ග	පැතිරී පවතින රටවල්/ ප්‍රදේශ
නිවර්තන	1..	ජාවා සුමාත්‍රා දූපත්
	නිවර්තන මෝසම් දේශගුණ	2...........,.................,මියන්මාර්
	3..	ඉන්දියාවේ ඊසාන දිග කොටස, බංගලාදේශය
	උෂ්ණ කාන්තාර දේශගුණය	4..
සෞම්‍ය	උණුසුම් සෞම්‍ය දේශගුණ	5..
	6..	නැගෙනහිර චීනය, ජපන් දූපත්
ශීත	7..	සයිබීරියානු කලාපය, උ. ආසියාව
	කඳුකර දේශගුණය	8..

(ii) දේශගුණ වර්ග තීරණය වීමට බලපාන සාධක තුනක් ලියන්න.　(ල. 03)

03. (i) ආසියාවේ ජීවත් වන ප්‍රධාන මානව වර්ග දෙකෙහි රූප සටහන් දෙකක් පහත දැක්වේ. එම මානව වර්ග නම් කර ඔවුන් අයත් රටවල් දෙක බැගින් දක්වන්න.

A

B

මානව වර්ගය : A ....　B.......................................

ජීවත් වන රටවල් 01..　01.......................................

02..　02.......................................　(ල. 06)

(ii) ආසියා මහාද්වීපයේ ජන ව්‍යාප්තිය හා සම්බන්ධ පහත සටහන සම්පූර්ණ කරන්න.

ජන ව්‍යාප්තිය

බලපාන භෞතික සාධක	ජනාධික කලාප	ජන හීන ප්‍රදේශයක්
01.	03.	05. ....
02.	04.	

(ල.05)

04. (i) පාකිස්ථානයේ ප්‍රධාන වගා කන්න දෙක, කාල සීමාව හා වගා කරන බෝග වර්ග ඇසුරින් පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

වගා කන්නය	බලපැවැත්වෙන කාල සීමාව	වගා කරන බෝග
කාරිෆ්	1..	2.. 3..
4..	නොවැම්බර් සිට මාර්තු දක්වා	5.. 6..

(ල. 06)

(ii) ජපානයේ නිෂ්පාදිත මෝටර් රථ ලොව පුරා ජනප්‍රිය වීමට බලපා ඇති හේතු තුනක් ලියන්න. (ල. 03)

(iii) ජපානයේ පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන දෙකක් නම් කරන්න. (ල. 02)

05. (අ) ආසියා මහද්වීපය දක්වෙන පහත සිතියමේ

(i) a) පකිස්ථානය

b) ජපානය

c) ඩුබායි

යන රටවල් දැක්වෙන අක්ෂර පිළිවෙලින් ලියන්න.

(ල. 03)

(ii) (a) ඩුබායි රාජ්‍යයේ ආර්ථිකයේ පදනම සකස් වී ඇත්තේ කුමක් මතද? (ල. 01)

(b) ඩුබායි සේවා මධ්‍යස්ථානයක් ලෙස දියුණු වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?(ල. 01)

(iii) ඩුබායි රට විසින් පවත්වාගෙන යන සේවා කර්මාන්ත තුනක් දක්වන්න. (ල. 06)

06. (i) ශ්‍රී ලංකාවේ භූවිෂමතා කලාප දක්වෙන යාබද සිතියමේ අංක 1, 2 හා 3න් දක්වා ඇති භූ විෂමතා කලාප නම් කරන්න. (ල. 03)

(ii) මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව ඉහත එක් එක් කලාපයේ සීමාවන් වගුව තුළ දක්වන්න. (ල. 03)

කලාපය	සීමාව (උස මීටර්)
1.	
2.	
3.	



(iii) සිතියමේ A,B හා C වලින් දක්වා ඇති භූ ලක්ෂණ නම් කරන්න.

ඉන් දෙකකට උදාහරණ එක බැගින් ලියන්න. (ල. 05)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

07. දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට :-

01. ආසියාවේ පිහිටි කාර්මික රටකි.

03. ආසියාවේ ප්‍රධාන මානව වර්ගයකි.

04. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කයකි.

06. මෙම ප්‍රදේශවල උෂ්ණත්වය අධිකය.

07. පැසිපික් සාගරයට ගලා බසින ගංගාවකි.

08. ආභරණ නිපදවීමට ගන්නා වටිනා ඛනිජයකි.

පහළට :-

02. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටි ආගමික වැදගත්කමක් ඇති දූපතකි.

03. නැගෙනහිර ආසියාවේ පිහිටි රටකි.

04. වෘක්ෂලතා වලින් පිරුනු ප්‍රදේශ මෙනමින් හඳුන්වයි.

05. ලෝකයේ ප්‍රධාන දේශගුණ කලාපයකි.

07. ඉන්දියන් සාගරයේ පිහිටි කුඩා දූපත් සමූහයකි.



SLGURU.LK
For Educational Purpose Only

"Live as if you were to die tomorrow. Learn as if you were to live forever." — Mahatma Gandhi

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

පළමු වාර පරීක්ෂණය - 2019
9 ශ්‍රේණිය
භූගෝලය පිළිතුරු පත්‍රය

I කොටස

01. නැගෙනහිර	06. ✓	11. 2	16. D
02. 30%	07. ✓	12. 4	17. E
03. චීනය	08. ×	13. 1	18. B
04. කැස්පියන්	09. ×	14. 2	19. A
05. කේතුධර	10. ✓	15. 3	20. C

II කොටස

01. (අ) i. බටහිර ඝාට්ස් (ල.01) v. ඉරාන සානුව (ල.01)
ii. සින්ධු ගඟ/ඉන්දු (ල.01) vi. J (ල.01)
iii. D (ල.01) vii. සමුද්‍රසන්ධිය (ල.01)
iv. චීනය (ල.01) viii. L (ල.01)

(ආ) 01. යූරල් කඳුවැටිය 3. සුවස් ඇළ 02. කැස්පියන් මුහුද 04. රතු මුහුද (ල. 2 x 4 = 08)

02. (ස) 1. නිවර්තන වර්ෂා දේශගුණය 2. ඉන්දියාව, ශ්‍රී ලංකාව
03. නිවර්තන සැවනා දේශගුණය 04. තාර් කාන්තාරය, මැදපෙරදිග රටවල්
05. මධ්‍යධරණී මුහුද අවට 06. තෙත් සෞම්‍ය දේශගුණය
07. ධ්‍රැව සහ තුන්ද්‍රා දේශගුණය 08. හිමාලය කඳු ආශ්‍රිත ප්‍රදේශ (ල. 08)

(ii) ● වර්ෂාපතනයේ වෙනස්කම් ● මහද්වීපික පිහිටීම ● මෝසම් සුළං බලපෑම
● කඳු පද්ධතිවල පිහිටීම ● සාගරික බලපෑම ● මුහුදු මට්ටමේ සිට උස ආදී
(ල.03)

03. (i) A මොංගොලොයිඩ් B. කොකොසායිඩ්
රටවල් - චීනය, ජපානය රටවල් - ඉන්දියාව, පාකිස්තානය, ශ්‍රී ලංකාව
මැලේසියාව, කොරියාව අදාල අනිකුත් රටවලද ලකුණු ලබා දෙන්න.(ල.06)

(ii) <u>ජන ව්‍යාප්තියට බලපාන සාධක</u>
භූ විෂමතාව, දේශගුණය, පස, ජල වහනය
<u>ජනාධික කලාප</u>
නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ගංගා නිම්න ආශ්‍රිත ලියා ඇත්නම් ඊටද ලකුණු ලබා දෙන්න.
<u>ජනහීන ප්‍රදේශ :</u>- මධ්‍යම ආසියාව, උතුරු දිග තැනි බිම්, මොංගෝලියාව, ගෝබි සහ තාර් කාන්තාර

04. (i) 1. අප්‍රේල් සිට ඔක්තෝම්බර් දක්වා 2. 3, කපු, වී, මිලට්, උක්
4. රාබි 5,6. තිරිඟු. බාර්ලි, ඕට්ස් (ල. 06)

(ii) උසස්තත්වය. සුබෝපභෝගී බව. ඉන්ධන කාර්යක්ෂකමතාව
කල්පැවැත්ම. නවීන උපාංග වලින් සමන්විත වීම. (ල. 03)

(iii) ප්ලාස්ටික් /පොලියෙස්ටර් පොලිප්‍රොප්ලින් (ල. 02)

05. (i) 1. B 2. C 3. A

(ii) a. පෙට්‍රෝලියම් නිෂ්පාදනය
b. ඩුබායිහී භෞතික පරිසරය කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය නොවීම (ල. 02)

(iii) 1. ලොව පෙර-අපර දෙදිග සම්බන්ධ වන ගුවන් ගමන් මධ්‍යස්ථානයක් වීම.
2. නිදහස් වෙළඳ වරායක් මෙන්ම මැද පෙරදිග ප්‍රධාන අපනයන මධ්‍යස්ථානයක් ලෙස ජෙබිල් අලි වරාය වැදගත් වීම.
3. සංචාරක ආකර්ෂණය හා සංචාරක සේවා සපයන සේවා මධ්‍යස්ථානයක් වීම.
4. ජාත්‍යන්තර සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.
5. ක්‍රිකට් සහ ටෙනිස් ක්‍රීඩාවේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩාංගන පහසුකම් සපයන ක්‍රීඩා මධ්‍යස්ථානයක් වීම.
6. "Dubai Maill" නමින් හැඳින්වෙන ලොව විශාලතම වෙළඳ මධ්‍යස්ථානය පිහිටුවා තිබීම.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

06. (i) 1. වෙරළබඩ තැන්න 2. අභ්‍යන්තර තැන්න. 3. මධ්‍යම කඳුකරය (ල. 03)

(ii) 1. 0 - 30m 2. 30m - 300m 3. 300m ට වැඩි

(iii) A - දූපත (කයිට්ස්, ඩෙල්ෆ්, මන්නාරම් දූපත) B - බොක්ක (කොඩ්ඩියාර්, වැලිගම, ආරුගම්)

C - තුඩුව (පේදුරු, දෙවුන්දර, ඇත්තුඩුව) (ල. 05)

07. <u>හරහට</u> <u>පහළට</u>

හරහට	පහළට
1 ජපානය 3. කොකසොයිඩ් 4. වව්නියාව	2. නයිනතිව් 3. කොරියාව 4. වනාන්තර
6. කාන්තාර 7. අමූර් 8. රත්රන්	5. නිවර්තන 7. අන්දමන්

SLGURU.LK
For Educational Purpose Only